සියලු ම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved]

# හෝමාගම අධ්‍යාපන කලාපය
## දෙවන වාර පරීක්ෂණය - 2016
## ගණිතය - 10 ශ්‍රේණිය

I කොටස

කාලය පැය දෙකයි

විභාග අංකය / නම :-............................................

............................................
නිවැරදි බවට අත්සන් කළේ

වැදගත්

- මෙම ප්‍රශ්න පත්‍රය පිටු 8 කින් සමන්විතය.
- මෙම පිටුවේත්, තුන්වැනි පිටුවේත් නියමිත ස්ථානවල ඔබගේ විභාග අංකය නිවැරදිව ලියන්න.
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
- පිළිතුරත් එම පිළිතුර ලබාගත් ආකාරයත් දැක්වීමට ඒ ඒ ප්‍රශ්නය යටින් තුබා ඇති ඉඩ ප්‍රමාණය ප්‍රයෝජනයට ගන්න.
- A කොටසෙහි අංක 1 සිට 25 තෙක් එක් එක් ප්‍රශ්නයට ලකුණු 02 බැගින් ද B කොටසෙහි එක් එක් ප්‍රශ්නයට ලකුණු 10 බැගින් ද හිමිවේ.
- කටු සටහන් සඳහා අවශ්‍ය වේ නම් උත්තර ලියන කඩදාසියක් බාවිතා කල හැක.

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා පමණි.

| | ප්‍රශ්න අංක | ලකුණු |
|---|---|---|
| A | 1 – 25 | |
| B | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| | 5 | |
| | මුළු එකතුව | |

| | |
|---|---|
| ............................ ලකුණු කළේ | ............................ සංකේත අංකය |
| ............................ පරීක්ෂා කළේ | ............................ සංකේත අංකය |
| ............................ ගණිත පරීක්ෂක | ............................ සංකේත අංකය |
| ............................ ප්‍රධාන පරීක්ෂක | ............................ සංකේත අංකය |

## A කොටස

**ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**

**01.** පෑන් 5 ක මිල රු. 75.00 කි. පෑනක මිල කොපමණද?

**02.** අගය සොයන්න. $3.5 + 1.3$

**03.** සුළු කරන්න. $3x + 2x$


**04.** විසඳන්න. $3x - 2 = 10$

**05.** කිලෝග්‍රෑම් 1.8 ග්‍රෑම්වලින් දක්වන්න.


To download past papers visit
www.vajirapani.blogspot.com

**06.** රු.150 ට ගත් පොතක් රු.170 ට විකිණීමෙන් ලැබෙන ලාභයේ ප්‍රතිශතය සොයන්න.

**07.** දී ඇති වෙන් රූප සටහනේ $A \cup B$ අඳුරු කර දක්වන්න.




**08.** රූපයේ දී ඇති තොරතුරු භාවිතයෙන් $A\hat{C}D$ හි අගය සොයන්න.



**09.** $8 = 2^3$ , ලඝු ගණක අංකනයෙන් ලියන්න.

**10.** $a = 5$ , $b = (-2)$ වනවිට $a^2 + b$ හි අගය සොයන්න.

**11.** $v = u + at$ සූත්‍රයෙහි $t$ උක්ත කරන්න.

**12.** පොදු පදය $3n + 1$ වන සංඛ්‍යා රටාවේ 151 වන්නේ කී වන පදයද?

**13.** බෙදීමේ ක්‍රමය භාවිතයෙන් වර්ගමූලය සෙවීමේ මුල් පියවර කිහිපයක් මෙහි දැක්වේ. එහි $x$ හා $y$ මගින් දැක්වෙන ඉලක්කම් ලියා දක්වන්න.

| | |
|---|---|
| | 2 . $y$ |
| $x$ | 6 . 00 |
| | 4 |
| 44 | 2 0 0 |
| | 1 7 6 |
| | 2 4 |

**14.** විදුලි උපකරණයක ආනයනික මිල රු. 20 000 කි. ඒ සඳහා අය කෙරෙන තීරු බදු ප්‍රතිශතය 10% නම් ගෙවිය යුතු තීරු බදු මුදල සොයන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

**15.** එක්තරා පරීක්ෂණයකට පෙනී සිටි අයදුම්කරුවන් 9 දෙනකු ලබාගත් ලකුණු පහත දැක්වේ.

48 , 40 , 58 , 55 , 63 , 55 , 64 , 35 , 42

එම ලකුණුවල,

**(i)** මාතය සොයන්න.

**(ii)** මධ්‍යස්ථය සොයන්න.


**16.** සුළු කරන්න. $\dfrac{2}{x} - \dfrac{3}{x+5}$

**17.** සාධක සොයන්න.

$4x^2 - 9$

**18.** $y = 2x - 3$ සමීකරණයෙන් දැක්වෙන සරල රේඛාවේ අනුක්‍රමණය හා අන්තඃඛණ්ඩය ලියන්න.

**19.** දී ඇති තොරතුරු උපයෝගී කර ගනිමින් ABCD සමචතුරස්‍රයේ වර්ගඵලය සොයන්න.




**20.** වත්තක් පිරිසිදු කිරීමට මිනිසුන් 4 දෙනකුට දින 6 ක් ගතවෙයි නම් මිනිසුන් 3 දෙනකුට එම වැඩ කොටස දින කීයකින් නිම කළ හැකිද?

To download past papers visit
www.vajirapani.blogspot.com

**21.** **(i)** 1 සිට 6 තෙක් අංක යෙදූ දාදු කැටයක් උඩදැමීමේදී ලැබිය හැකි ප්‍රතිඵල ඇතුළත් නියැදි අවකාශය ලියන්න.

**(ii)** දාදු කැටය උඩදැමීමේදී ප්‍රථමක සංඛ්‍යාවක් ලැබීමේ සම්භාවිතාව ලියන්න.


**22.** මෝටර් රථයක් පැයකදී කිලෝමීටර 60 ක් ගමන් කළේ නම් එය එම වේගයෙන්ම පැය $2\,{}^{1}/_{2}$ කදී ගමන් කරන දුර සොයන්න.

**23.** පන්තියක සිසුන්ගෙන් $\frac{3}{5}$ ක් ගැහැණු ළමුන් ය. පිරිමි ළමුන් ගණන 16 ක් නම් පන්තියේ මුළු ළමුන් ගණන කොපමණද?

**24.** $lg_2 = 0.2010$ ද $lg_3 = 0.4771$ ද නම් $lg_{12}$ හි අගය සොයන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

**25.** සමතලා බිමක AB සෘජු පාරක් හා පාරට $4m$ ක් දුරින් ඇති ගසක පිහිටීම රූපයේ දැක්වේ. පාරට $6m$ දුරින් ද ගසට $5m$ දුරින් ද වූ D ලක්ෂ්‍යයක පිහිටීම සොයාගත හැකි ආකාරය දළ රූප සටහනක දක්වන්න.



**B කොටස**

**ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**

**01. (a)** සුළු කරන්න. $\left(2\frac{1}{2} - 1\frac{2}{3}\right) \div 1\frac{1}{9}$ *(ල. 4)*

**(b)** මිනිසකු තම මාසික වැටුපෙන් $\frac{1}{3}$ ක් ආහාර සඳහා ද ඉතිරියෙන් $\frac{1}{4}$ ක් ගෙවල් කුලී සඳහා ද වැය කරයි. ඉන් පසු ඔහු ලඟ ඉතිරි වූ මුදල රු 12 000 ක් විය.

**(i)** ආහාර සඳහා වැය කල පසු ඉතිරි වූ කොටස වැටුපෙන් කවර භාගයක්ද? *(ල. 1)*


**(ii)** ගෙවල් කුලී සඳහා වැය කල කොටස වැටුපෙන් කවර භාගයක්ද? *(ල. 2)*

To download past papers visit www.vajirapani.blogspot.com

**(iii)** ආහාර සහ ගෙවල් කුලී සඳහා වැය කල පසු ඉතිරි වූ කොටස වැටුපෙන් කවර භාගයක්ද? *(ල. 2)*

**(iv)** ඔහුගේ මාසික වැටුප කොපමණද? *(ල. 1)*

**02.** දැල්පන්දු ක්‍රීඩාව සඳහා යොදා ගනු ලබන සෘජුකෝණාස්‍රාකාර හැඩයෙන් යුතු ක්‍රීඩා පිටියක දළ රූප සටහනක් පහත දැක්වේ.




**(i)** දැල්පන්දු පිටියේ පරිමිතිය සොයන්න. *(ල. 1)*

**(ii)** එහි වර්ගඵලය සොයන්න. *(ල. 2)*

**(iii)** ක්‍රීඩා පිටියේ දෙකෙලවර පිහිටි අර්ධ වෘත්තාකාර ගෝල කවයක විෂ්කම්භය 5.6 m ක් නම් එක් ගෝල කවයක වර්ගඵලය ගණනය කරන්න. *(ල. 3)*

**(iv)** ක්‍රීඩා පිටියේ අර්ධ වෘත්තාකාර කොටස්වල වැලි අතුරා ඇති අතර ඉතිරි කොටසේ තණකොල සිටුවා ඇත්නම් තණකොල සිටුවා ඇති කොටසේ පරිමිතිය සොයන්න. *(ල. 4)*

03. (a) (i) තුල්‍ය අනුපාතයක් ලබාගැනීම සඳහා හිස් කොටුවට යෙදිය යුතු සංඛ්‍යාව සොයන්න. (ල. 2)

$3 : \square = 12 : 20$

(ii) සැබෑ බිමක 1 000 m ක් 10 cm කින් නිරූපණය වන ලෙස පරිමාණ රූපයක් ඇඳ ඇත්නම් එම පරිමාණය අනුපාතයක් ලෙස දක්වන්න. (ල. 3)

(b) සිමෙන්ති හා වැලි මිශ්‍ර කිරීමෙන් සකස් කරගත් A හා B බදාම මිශ්‍රණ දෙකක් ඇත. A මිශ්‍රණයේ සිමෙන්ති හා වැලි මිශ්‍ර කර ඇති අනුපාතය 2 : 3 වේ. B මිශ්‍රණයේ සිමෙන්ති හා වැලි මිශ්‍ර කර ඇති අනුපාතය 4 : 5 වේ.

(i) A මිශ්‍රණයේ තාච්චි 50 ක ඇති සිමෙන්ති තාච්චි ගණන කොපමණද? (ල. 2)

(ii) B මිශ්‍රණය සෑදීමට යොදාගත් සිමෙන්ති තාච්චි ගණන 20 ක් නම් යොදාගත් වැලි තාච්චි ගණන සොයා අවසානයේ ලැබෙන B මිශ්‍රණය තාච්චි ගණන සොයන්න. (ල. 3)

To download past papers visit
www.vajirapani.blogspot.com

04. එක්තරා නගරයක දින 30 ක් තුල එක්රැස් කරන ලද වර්ෂාපතන අගයයන් මිලි මීටරවලින් පහත දැක්වේ.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 13 | 34 | 45 | 23 | 32 | 24 | 21 | 36 | 34 | 35 |
| 47 | 32 | 25 | 12 | 60 | 46 | 53 | 33 | 38 | 28 |
| 47 | 29 | 43 | 55 | 37 | 35 | 38 | 41 | 37 | 35 |

(i) දින 30 තුල ලැබී ඇති අඩුම සහ වැඩිම වර්ෂාපත අගයයන් මොනවාද? (ල. 2)

(ii) ඉහත දත්ත සමූහය සඳහා සකස්කළ ප්‍රගණන වගුවක් පහත දැක්වේ. එම වගුව සම්පූර්ණ කරන්න.

| පන්ති ප්‍රාන්තරය | ප්‍රගණන ලකුණ | සංඛ්‍යාතය (දින ගණන) |
|---|---|---|
| 11 – 20 | | |
| 21 – 30 | | |
| 31 – 40 | | |
| 41 – 50 | | |
| 50 – 60 | | |

(ල. 3)

(iii) මෙම ව්‍යාප්තියේ මාත පන්තිය කුමක්ද? (ල. 1)

**05.** පෙට්ටියක් තුල ඇති එකම තරමේ හා එකම හැඩයේ ටොෆි වර්ග කිහිපයක් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ඇපල් රස | දොඩම් රස |
|---|---|---|
| රෝස පාට | 12 | 7 |
| කහ පාට | 15 | 16 |

ළමයෙක් අහඹු ලෙස පෙට්ටියෙන් ටොෆියක් ඉවතට ගනී නම් එය,

**(i)** ඇපල් රස ටොෆියක් වීමේ සම්භාවිතාව සොයන්න. *(ල. 2)*

**(ii)** දොඩම් රස ටොෆියක් වීමේ සම්භාවිතාව සොයන්න. *(ල. 2)*

To download past papers visit
www.vajirapani.blogspot.com

**(iii)** රෝස පාට ඇපල් රස ටොෆියක් වීමේ සම්භාවිතාව සොයන්න. *(ල. 2)*

**(iv)** රෝස පාට දොඩම් රස ටොෆියක් වීමේ සම්භාවිතාව සොයන්න. *(ල. 2)*

**(iii)** කහ පාට ඇපල් රස ටොෆියක් වීමේ සම්භාවිතාව සොයන්න. *(ල. 2)*